# ක්‍රිස්තු පූර්ව යුගයේ පුරාවිද්‍යාත්මක සාධක හමුවන වේගිරි කන්ද

ගම්පොළ විජය හිමි[8]

---

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වේගිරිය-බටහිර ග්‍රාම නිලධාරී වසමේ වේගිරි කන්ද පිහිටා ඇත. තත් පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සාපේක්ෂ පිහිටීම උතුරු අක්ෂාංශ $7^0$ 199' 688" ත් නැගෙනහිර දේශාංශ $80^0$ 568' 888" ත් අතර වේ. මහනුවර - ගම්පොළ මාර්ගයේ ගෙලිඔය නගරයෙන් දකුණු පසට ගමන් කර බූවැලිකඩ-ගෙලිඔය මාර්ගයේ කි.මී. 9ක් පමණ මඟ ගෙවා වේගිරි කන්ද පුරාවිද්‍යා ක්ෂේත්‍රට ගමන් කළ හැකි ය. අතීතයේ ''කෝවිල් කන්ද'' යැයි හඳුන්වා ඇති වේගිරි කන්ද පුරාවිද්‍යා ක්ෂේත්‍රය වර්ග කිලෝමීටර් 10ක පමණ අවකාශයක ව්‍යාප්ත ව ඇත. තත් පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ක්‍රිස්තු පූර්ව යුගයට අයත් ශිලා ලේඛන 2ක් දැකගත හැකි ය. අතීතයේ **"බට තිස්ස ලෙන"** ලෙස හැඳින්වූ **"වවුල් ගල් ලෙන"** ආශ්‍රිත ව තත් ශිලා ලේඛන දැකගත හැකි ය. මෙම ශිලා ලේඛන අතරින් එක් ශිලා ලේඛනයක් වාර්තා කර ඇති මුත් අනෙක් ශිලා ලිපිය නිසි ආකාරයෙන් වාර්තා කර නොමැත. ශිලා ලිපිවල අන්තර්ගතය අනුව අතීතයේ ප්‍රදේශය ආශ්‍රිත ජීවත් වූ විවිධ වර්ගයේ කුල ශ්‍රේණි පිළිබඳ සඳහන් වීමක් දැකගත හැකි ය. ලංකාවේ විවිධ පුරාවිද්‍යා ක්ෂේත්‍රයන් ආශ්‍රිත ව පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන දැකිගත හැකි ය. එ ලෙස පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන සහිත ස්ථානයන් මධ්‍ය කඳුකර ප්‍රදේශයේ සීමිත ව පවතී. මේ අනුව මෙම පුරාවිද්‍යා ක්ෂේත්‍රයට මධ්‍ය කඳුකරයේ විශේෂිත තැනක් හිමි වේ. සෙල්ලිපි වලට අමතර ව වේගිරි කන්ද ආශ්‍රිත ව කුඩා හා විශාල ප්‍රමාණයේ ගල් ලෙන් 22 පමණ දැකිගත හැකි ය. උක්ත ලෙන් අතුරින් කටාර සහිත ලෙන් 9 පමණ වන අතර ඇතැම් ලෙන් මිනිස් වාසය සඳහා භාවිත වන බවක් දක්නට ලැබේ. වර්තමානයේ වේගිරි කන්ද පුරාවිද්‍යා ස්ථානය වේගිරිය ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානයේ ම කොටසක් වශයෙන් දැකිය හැකි ය. නමුත් ප්‍රදේශවාසීන් විශාල වශයෙන් වේගිරි කන්දට අයත් භූමිය භාවිතයට ගැනීම හේතුවෙන් ක්‍රිස්තු පූර්ව යුගයට ගමන් කරනු ලබන වේගිරි කන්ද පුරාවිද්‍යා ස්ථානය විනාශයට බඳුන් වෙමින් පවති. වර්තමානයේ පවා භාවනා මධ්‍යස්ථානයක් වශයෙන් පවතින තත් ස්ථානය අතීතයේ ද භාවනායෝගී භික්ෂූන්ගේ වාසස්ථානයක් වශයෙන් පැවැති බවට හමු ව ඇති කටාර සහිත ලෙන් හා ශිලා ලේඛන සාධක වලින් පැහැදිලි වේ. තත් ස්ථානයෙන් හමුව ඇති සෙල්ලිපි අනුව පුරාවිද්‍යා ස්ථානය ක්‍රිස්තු පූර්ව යුගය තෙක් ගමන් කරන අතීතයකින් යුක්ත වැදගත් ස්ථානයකි.

ප්‍රමුඛ පදඃ වේගිරි කන්ද, කෝවිල් කන්ද, බට තිස්ස ලෙන, වවුල් ගල් ලෙන

---

[8] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, gampolavijayathero@gmail.com.